www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඔබාමාගේ කැත්රිනා

## Obama's Katrina

2011 ජුනි 29

2005 වසරේ අගෝස්තු මස ඇතිවූ කැත්රිනා කුනාටුව නිව් ඕර්ලියන්ස් හා මිසිසිපි ගල්ෆ් වෙරල තීරයේ වැඩි කොටසක් වනසා දැමීම මගින් බුෂ් පාලන තන්ත්‍රයේ බෙලහීනත්වය හා සාපරාධී නොතකා හැරීම හෙළිදරව් කලේය. එක්සත් ජනපද ඉන්ජිනේරු බලකායන් විසින් පාලිත ගං ඉවුරු බිඳීයාමෙන් යෝධ ඇමෙරිකන් නගරයක් මුලුමනින්ම වැනසී ගියේය. රාජ්‍ය හදිසි අවස්ථා කලමනාකරන දෙපාර්තමේන්තුවෙහි (එෆ්ඊඑම්ඒ) ප්‍රධානියා වන මයිකල් බ්‍රවුන් "මහැඟි සේවාවක්" ඉටු කලේ යැයි කියමින් බුෂ් ඔහුට අත්පොලසන් දෙන අතරේ එෆ්ඊඑම්ඒ විසින් සහන සේවාවන් උඩුයටිකුරු කලේය. නිව් ඕර්ලියන්ස්හි පමනක් දහසකට වැඩි ජනයා මරනයට පත් වූ අතර කුනාටුව බැටදුන් කලාපයේ අඩමිලියනයක් පමන ජනයා, ඉන් බොහෝ දෙනෙක් යලි නොඑන්නම, ප්‍රදේශය අත්හැර ගියෝය.

ඔබාමා පාලන තන්ත්‍රය මෑත වසරවලදී ඇමෙරිකාවේ ග්‍රාමීය හා සුලු නගරවලට බලපෑ කුඩා පරිමානයේ කුනාටු මාලාවක මෙහෙයුම් කටයුතුවල වගකීම දරා සිටියි. වික්ස්බර්ග්, මිසිසිපි, ටුස්කාලූසා, ඇලබාමා ජොප්ලින්, මිසූරි මිනොට්, නෝර්ත් ඩකෝටා යනදිය වැනසී ගිය නගර පිලිබඳව හොඳම උදාහරන වේ. මේ සෑම සිදුවීමක දී ම ස්වාභාවික විපත් සමාජ ව්‍යසනයන් බවට පත්ව තිබෙන්නේ ප්‍රාන්ත රාජ්‍යය හා විශේෂයෙන් මධ්‍යම ආන්ඩුව පැත්තෙන් සිදුව ඇති නොතැකීම හා නොහැකියාව නිසාවෙනි.

පසුගිය මාස තුනේ ආන්තික කාලගුනික ප්‍රපංචය කිසියම් ආකාරයකින් ගෝලීය උෂ්නත්වයේ බලපෑම පෙන්නුම් කරන අතර, ඇමරිකාවේ බටහිර මධ්‍යම, දකුන හා නිරිතදිග ප්‍රදේශ ගංවතුර, ටොර්නාඩෝ සුලි කුනාටු හා ලැව්ගිනිවල දීර්ඝකාලීන හා ඛේදනීය අත්දැකීමක් බවට පත්ව තිබේ. මෙම සංසිද්ධිය මෙක්සිකෝ බොක්ක ඔස්සේ හමා යන චන්ඩ හරිකේන් කුනාටු වලදී සේම විශාල කලාපයක පැතිර පවතින මිසූරි හා මිසිසිපි ගංගා නිම්න ප්‍රදේශ වලට ද හුරු පුරුදුය. එහෙත් ප්‍රාන්තීය ආන්ඩු හා මධ්‍යම ආන්ඩුව කැත්රිනා කුනාටුවට දැක්වූ ප්‍රතිචාරය පෙන්නුම් කලේ, ජාතික හා ජාත්‍යන්තර අවමානයක් වූ කල් තියා සූදානම්ව නොසිටීමත් කුනාටුව ඇතිවීමෙන් අනතුරුව පෙන්වූ නොතැකීමේත් සම්මිශ්‍රනයකි.

මැයි මාසයේදී මිසිසිපි ගංගාවේ පහත කොටසේ ගලා ගිය ජල ධාරිතාවත්, මේ මාසයේදී මිසූරි ගංගාවේ ඉහල කොටස්වල හා ඉන් ද උතුරේ පිහිටි ගංගාවන් ගෙනගිය ජලකඳ ද හමුදා ඉංජිනේරු බලකායන් හා ආන්ඩුවේ නිලධාරීන් විසින් පාලනය කරන ගංවතුර පාලක පද්ධතිය අඩපන කර දැම්මේය. මෙම ව්‍යසනයන් මුලුමනින්ම පෙරදැකිය හැකි විය. උදාහරනයක් ලෙස, මිනොට් ප්‍රදේශය ගිල්වා දැමූ මිසූරි හා සූරිස් ගංගා ඔස්සේ ගලාගිය ජලකඳ පිලිබඳව එක්සත් ජනපද හා කැනේඩියානු රොකී කඳුවැටිවල හිම කුට්ටි මැන බැලූ ජලය ගලා යාමේ නිවැරදි ප්‍රස්ථාර මගින් සති ගනනකට කලින් පෙරදැක තිබින.

පවත්නා බැම් හා වේලි නිසැක කඩා වැටීමක තර්ජනයට මුහුන දී තිබීම නිසාවෙන් බැම් හා ජලාශ ඉංජිනේරුවන්ට පහල නිම්නයන්ට විනාශකාරී ප්‍රතිවිපාක ගෙන දෙමින් දැවැන්ත ජල ධාරිතාවක් නැවත නැවතත් මුදාහැරීමට සිදුවූ අවස්ථා තිබුනි. සිදුවීම් කිපයකදීම - විශේෂයෙන්ම ලූවිසියානා හා මිසූරිවල- එක් පැත්තක ගංවතුර අවදානම අවම කිරීම පිනිස තවත් ප්‍රදේශයක් ගිල්වා දැමීමේ තීන්දු ගෙන තිබින. බැටන් රොග් හා නිව් ඕර්ලියන්ස් ආරක්ෂා කර ගැනුනේ ගංවතුර අඩු ජනගහනයක් වෙසෙන අචපාලයා ගංගා ද්‍රෝනියට හරවා ජලය යැවීමෙන් පමනි.

කුනාටු ධාරා ටොර්නාඩෝ තත්වයන් සහ ගංවතුර වැනි සිදුවීම් සම්බන්ධයෙන් තනි තනි වසයෙන් ගෙන අනාවැකි පල කිරීම අසීරුයග එහෙත් විශේෂයෙන්ම "ටොර්නාඩෝ මාවත" ලෙස විරුදාවලි ලබා ඇති ඔක්ලොහොමාල කැන්සාස් හා මිසූරි ප්‍රදේශ එවැනි ක්ෂනික හා ප්‍රචන්ඩ සුලි කුනාටු පුපුරා යාම පිලිබඳව ප්‍රකටයග අප්‍රේල් මාසයේදී දකුනු ප්‍රදේශ විනාශ කල හා මැයි 22 මිසූරිහි ජොප්ලින්වල තුනෙන් එක් පංගුවක් විනාශ කල සුලි කුනාටු පෙන්නුම් කර ඇත්තේ ටොර්නාඩෝ අනතුරු ඇඟවීම් පද්ධතියේ දුර්වලකමත් විශේෂයෙන්ම ගම්බද දකුනු ප්‍රදේශයේ නිවාස ඉදිකිරීම්වල දිලිඳු ස්වභාවයත්යග

නැගෙනහිර ඇරිසෝනා හා වෙරලබඩ උතුරු කැරොලිනා එකිනෙකින් දුරස්ථව පිහිටා ඇතත් එම ප්‍රදේශ විනාශ කල ලැව් ගිනි බලගතු සමාජ සංරචකයකින් යුත් තවත් ස්වභාවික විප්පත්තියකිග දශක ගනනාවක් තිස්සේ ඉඩම් පරිපාලන ක්ෂේත්‍රයටල විශේෂයෙන්ම ජාතික වනාන්තර සංරක්ෂනය සඳහා කෙරෙන අඩු අයෝජන ද අතිශය දරුනු වියලි කාලගුනික කොන්දේසි ද සමඟ බද්ධව පසුගිය මාසය තුලදී පමනක් 2010 වසරේ සිදුවූ සමස්ත විනාශයටම වඩා වැඩි අක්කර ගනනක් විනාශ කල ලැව් ගිනි සඳහා උපරිම කොන්දේසි නිර්මානය කලේය. ජුනි 27 දින සිදුවූ එවැනි විශාලම ලැව්ගිනිවලින් එකක් හේතුවෙන්, 40,000ක ජනගහනයකින් යුත් නිව් මෙක්සිකෝවල ලොස් ඇලමෝස් නගරය මුලුමනින්ම ඉවත් කිරීමට සිදුවිය.

ස්වාභාවික ව්‍යසනයකින් න්‍යෂ්ඨික බලාගාරවලට හානි සිදුකොට විකිරනශීලී වායු කාන්දුවකට කොනදේසි නිර්මානයවූ ජපානයේදී මෙන් මෙම විනාශයන්ගේ බලපෑම ද බෙහෙවින් නරක අතට හැරීමේ ඉඩකඩ තිබේ. එක්සත් ජනපදයේ නශ්‍යෂ්ඨික බලගාර තුනක් මේවන විට තර්ජනයට ලක්ව පවතී. මෙයින් දෙකක් ගංවතුර තත්වයකදී ක්ෂනිකව ක්‍රියාත්මක වීමේ අවස්ථා අවමයැයි අඳුනා ගෙන ඇති නෙබ්රස්කාවේ මිසූරි ගංගාව ඔස්සේ පිහිටා ඇති අතර අනෙක න්‍යෂ්ටික අපද්‍රව්‍ය විශාල ප්‍රමානයක් ගබඩා කොට ඇති ලොස් ඇලමෝස්වල පිහිටි එක්සත් ජනපදයේ විශාලතම න්‍යෂ්ටික අවි පර්යේෂන මධ්‍යස්ථානයයි.

ස්වභාවික විපත්තීන් සඳහා සූදානමේ දුබලකම අත්‍යවශ්‍ය හදිසි සහනාධාර හා එම විපත් වලට ගොදුරුවූවන් සඳහා වන්දි පිරිනැමීම මධ්‍යම ආන්ඩුව විසින් ප්‍රතික්ෂේප කිරීම සමඟ බද්ධව තිබේ. දස දහස් ගනනක් ජනයාට ගංවතුර, ටොර්නාඩෝ හා ලැව්ගිනි නිසාවෙන් ඔවුන්ගේ ගෙවල් දොරවල්, රැකියා හෝ සුලු ව්‍යාපාර අහිමිව ගොස් තිබෙන අතර සුලු ආධාරයකින් නොඑසේනම් කිසිවක් නැතිවම කල් ගෙවීමට සිදුව තිබේ.

උදාහරනයක් ලෙස, මිනොට්හි ගෙවල් 4000ක් ගංවතුරට යටවූ අතර ගංවතුර රක්ෂන සතුව තිබුනේ 500කට අඩු ප්‍රමානයකටය. මූලික වසයෙන්ම මෙයට හේතු වූයේ, නව ජලාශද ඇතුලු ගංවතුර පරිපාලන පද්ධතියේ වර්ධනය වී ඇති තත්වය තුල ප්‍රධාන ගනයේ ගංවතුර ගැලීමකට ඇත්තේ බෙහෙවින් අඩු ඉඩකි යනුවෙන් නිගමනය කල 2000 වසරේ අධ්‍යයනකින් පසු මධ්‍යම ආන්ඩුව එවැනි සහන පිරිනැමීම නතර කල නිසාවෙනි.

එහෙත් සැබවින්ම සිදුවූයේ වසර 130ක ගංවතුර වාර්තාව බිඳ දමමින් සෝරිස් ගංගාවේ ජල මට්ටම අඩි අටකින් ඉහල නැගීමයි. මේ දක්වා උතුරු ඩැකොටාවේ, බොහෝ ගම්බද ප්‍රදේශ එක සමාන අයුරින්ම විනාශවී තිබියදීත්, එෆ්ඊඑම්ඒ ආධාර පිරිනැමීම මිනොට් හා බිස්මාක් නගර සහ ඒවායේ යාබද පෙදෙස් වලට පමනක් සීමාකොට තිබින.

කලින් පැවති කොන්ක්‍රීට් සැකිල්ලට වඩා කිසිවක් ඉතිරිව නොමැති ඇලබාමාවල ගංවතුරින් හානියට පත් නිවාස වලට ''බරපතල හානි සිදුවී නැතිබව'' පවසමින් එෆ්ඊඑම්ඒ පරීක්ෂකවරුන් ඒවාට වන්දි ගෙවීම ප්‍රතික්ෂේප කිරීමේ සිද්ධීන් පිලිබඳ පුවත්පත් වාර්තා පලවිය. එක් නිවැසියෙකුට සිය නිවසේ පිටත බිත්ති තුනක්ද වහලයේ අඩක්ද අහිමිව තිබූ අතර ඔහුගේ අහිමි වීම් ''සුලු හානි'' වසයෙන් විස්තර කරමින්ද ''ඔබට හෝ ඔබගේ ඉඩම් හිමියාට මෙම පිලිසකර කිරීම් සිදුකර ගත හැකිය යන්න බලාපොරොත්තුවීම යුක්ති සහගත''යැයි විස්තර කරමින් ද ලිපියක් ලැබුනේය.

වාර්තාගත ටොර්නාඩෝ සංඛ්‍යාවක් ප්‍රාන්ත රාජ්‍යය කීතුකරගෙන යාමෙන් මාස දෙකකට පසු ඇලබාමාවේ එෆ්ඊඑම්ඒ ආධාර සඳහා 82,250ක් වන ඉල්ලුම්පත් අතුරෙන් අනුමැතිය ලැබුනේ 14,218කට පමනි. *බර්මින්ග්හැම් නිව්ස්* පුවත්පතට අනුව, එෆ්ඊඑම්ඒ නිලධාරීන් සඳහන් කලේ තම ''ආයතනය ක්‍රියාත්මක වන්නේ නගරය තුල කුනාටුවට ගොදුරුවූවන් පෙර සිටි මට්ටමට යලි එසවීමට නොව, පුනර්ජීවන හා යලි ගොඩ නැඟීමේ සන්තතියට ආරම්භයක් ලබා දීමට'' බවයි.

නැගෙනහිර ටෙනසි මිටියාවතේ, ටොර්නාඩෝ හානි වෙනුවෙන් එෆ්ඊඑම්ඒ ආධාර ලබා ගැනීමට ඉදිරිපත් කර තිබූ ඉල්ලුම්පත් 6,731න් 1229ක් පමනක් පිලිගත් අතර සුදුසුකම් සැපිරී නැතයි කියමින් ඉල්ලුම්පත් 2,000කට වැඩි සංඛ්‍යාවක් ප්‍රතික්ෂේප කෙරුනි.

වොෂිංටනයේදී, රිපබ්ලිකන් පාලිත නියෝජිත මංත්‍රී මන්ඩල සාමාජිකයින් ෆෙඩරල් ව්‍යසන සහන අරමුදල කප්පාදු කල අතර පෙර නොවූ විරූ ආන්තික කාලගුන වෙනස්කම් හේතුවෙන් ඉහල යන ඕනෑම වියදමක් අනෙකුත් ගෘහස්ත සමාජ වැඩපිලිවෙලවල් වලට කෙරෙන පිරිවැය කප්පාදු හරහා ඩොලරයෙන් ඩොලරය පියවා ගත යුතු යයි ඉල්ලා සිටියේය.

කල් තියා අවශ්‍ය සූදානම ඇති කිරීම හෝ සිදුවීමෙන් අනතුරුව ඉතා කඩිනමින් සමාජ සම්පත් හා මානුෂික සහන සැලසිම, පිලිසකර කිරීමේ කටයුතු සංවිධානය කිරීම යන කිසිවක් කිරීමට ඇමෙරිකානු ධනවාදය අසමත් බව මෙම ස්වභාවික විපත්තීන් මාලාව මඟින් සලකුනු කර තිබේ.

ගංවතුර, ටොර්නාඩෝ හා ලැව්ගිනිවලින් විනාශයට පත් සියලු දෙනා මුලුමනින්ම යථා තත්වයට පත් කල යුතුය. විනාශ වූ නිවාස, ගොවිපලවල් හා අනෙකුත් සුලු ව්‍යාපාරවලටට සහ තම ආදායම් මාර්ග අහිමි වූවන්ට වන්දි පිරිනැමීමට ඩොලර් බිලියන ගනන් යෙදවිය යුතුය. රැකියා විරහිතයන් සේවයේ යෙදවීමට සහ ජලාශ හා ගංවතුර පාලන පද්ධති, ටොර්නාඩෝ අනතුරු ඇඟවීමේ පද්ධති හා ඉඩම් පරිපාලනය මෙන්ම ලැව්ගිනි වැලක්වීමේ ක්‍රමෝපායන් නවීකරනය කිරීමටත් ඒවා යලිගොඩනැඟීමටත් යෝධ පොදුවැඩ පිලිවෙලවල් දියත් කල යුතුය.

එවැනි පරිශ්‍රමයක් සඳහා අවශ්‍ය සම්පත් තවමත් ලෝකයේ ධනවත්ම රටවන එක්සත් ජනපදයේ ඕනෑ තරම් තිබේ. එහෙත් ඒවා එක්සත් ජනපද ආර්ථිකය හා ආන්ඩුව යන දෙකෙහිම අධිකාරිය දරා සිටින මූල්‍යය කතිපායාධිකාරය විසින් පොදිගසා ගෙන තිබේ.

මෙම සංගත ප්‍රභුව හා එහි දේශපාලන පක්ෂ දෙක වන ඩිමොක්‍රටික් හා රිපබ්ලිකන් පක්ෂ දෙක පෙරලා දැමීම සඳහා කම්කරු පන්තිය, පෞද්ගලික ලාභය සඳහා නොව මානව අවශ්‍යතා වෙනුවෙන් ආර්ථික ජීවිතයේ මූලිකාංග සංවිධානය කරන සමාජවාදී පිලිවෙත් සඳහා විප්ලවවාදී අරගලයකට කැපවූ තමාගේම ස්වාධීන මහජන දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නැඟිය යුතුය.

**පැට්‍රික් මාටින්**

© www.wsws.org